# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2036/23 - 2017 සැප්තැම්බර් මස 13 වැනි බදාදා - 2017.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත

2017 අංක 7 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනතින් අවසන්වරට සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලද නියෝග.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

නියෝග

01. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වැනි වගන්තියට අදාළව සාදන ලදුව, 2007 ජුනි 20 වැනි දිනැති අංක 1502/10 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ද, 2007 ජූලි 18 වැනි දිනැති අංක 1560/06 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ද, 2008 අප්‍රේල් 22 වැනි දිනැති අංක 1546/9 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ද සංශෝධිත නියෝගයන් ඒ යටතේ මීන් පෙර සිදු කරන ලද යම්කිසි සංශෝධනයකට අගතියක් නොවන සේ මෙයින් අවලංගු කරනු ලැබේ.

02. (1) 3 වන හෝ 4 වන නියෝගයන් හි යම් ඡේදයක සඳහන් යම් වෙළඳමක හෝ ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්,

(i) එම වෙළෙඳමෙන් හෝ ව්‍යාපාරයෙන් එම කාර්තුව සඳහා ලබන පිරිවැටුම එම ඡේදයට අනුකූලව නිශ්චය කිරීම ;

(ii) ඉහත සඳහන් පනතේ 2 වැනි වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධාන නොසලකා හැරීම ; සහ

(iii) එසේ නිශ්චය කරන ලද පිරිවැටුම සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ IV වන උපලේඛනයේ I අයිතමයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට අනුව ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීම,

කළ හැකිය.

(2) එසේ කටයුතු කළ හැකි යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් සියලු කාර්යයන් සඳහා ඉහත සඳහන් පනතේ උපලේඛනයට අනුකූලව ක්‍රියා කර ඇති සේ සලකනු ලැබිය යුතු ය.

03. යම් භාණ්ඩ මෙහෙයුම්කරුවෙකුගේ වෙළඳාමක හෝ ව්‍යාපාරයක යම් අදළ කාර්තුවක් සඳහා පනතේ 2 වගන්තියේ (3) උප වගන්තියේ (ආ) ඡේදයට අනුකූලව නිශ්චය කරන ලද පිරිවැටුමෙන්, යම් තැනැත්තෙකු සතු හෝ එම තැනැත්තා විසින් කුලියට ගන්නා ලද යම් නැවකට හෝ ගුවන් යානයකට පටවන ලද යම් නැව් බඩු එම තැනැත්තා විසින් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් එම තැනැත්තාට එම භාණ්ඩ මෙහෙයුම්කරුවා විසින් ගෙවිය යුතු මුදල අඩු කළ යුත්තේ ය.

04. යම් වෙළෙඳමක හෝ ව්‍යාපාරයක අදළ යම් කාර්තුවක් සඳහා

(i) යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන, නොකැපූ ස්වරූපයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රළු දියමන්ති හෝ මැණික් කපා ඔප දමා අපනයනය කරන වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක එම කාර්තුව සඳහා එම රළු දියමන්තිවල හෝ මැණික් වල මි. ර. ගැ. (CIF) වටිනාකම ඉක්මවන එම ආයනයවල නැ. තෙ. නො. (FOB) වටිනාකමේ අතිරික්තය ;

(ii) යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන NFE පදනම මත ආනයනය කළ ද්‍රව්‍යවලින් නිපදවන ලද ඇඟලුම් අපනයනය කිරීමේ වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක එම කාර්තුව සඳහා එවැනි ද්‍රව්‍යයන්ගේ මි. ර. ගැ (CIF) වටිනාකම ඉක්මවන එම අපනයනවල නැ. තෙ. නො. (FOB) වටිනාකමේ අතිරික්තය ;

(iii) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන NFE පදනම මත ආනයනය කරන ලද ද්‍රව්‍යවලින් ශ්‍රී ලංකාවේ දී නිපදවන ලද ඉහත (ii) වන ඡේදයේ සඳහන් ඇඟලුම් හැර වෙනත් භාණ්ඩයක් අපනයනය කිරීමේ වෙළෙඳාමක හෝ ව්‍යාපාරයක, එම කාර්තුව සඳහා එවැනි භාණ්ඩවල මි. ර. ගැ. (CIF) වටිනාකම ඉක්මවන එම අපනයනවල නැ. තෙ. නො. (FOB) වටිනාකමේ අතිරික්තය ;

(iv) යම් ප්‍රාථමික වෙළෙන්දෙකු විසින් ;

- සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා එම කාර්තුව තුළ ආයෝජිත මුදල ; සහ

- එම කාර්තුව තුළ එළඹී යම් ප්‍රති මිල දී ගැනීමෙ ගනුදෙනුවකට අදළව ගෙවූ පොළිය හෝ ලබා දුන් වට්ටම,

යන දෙකෙහි එකතුව ඉක්මවන, එම ප්‍රාථමික වෙළෙන්ද සතුව තිබූ සුරැකුම්පත් විකිණීමෙන් ලැබෙන මුදලේ අතිරික්තය.

එකී වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ පිරිවැටුම විය යුත්තේ ය.

ඉහත පනතේ 2 වගන්තියෙහි (3) උපවගන්තියෙහි පිරිවැටුම නිර්වචනය කිරීමේ දී පිළිවෙලින් (අ) ඡේදයේ හා (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති අඩු කිරීම් සහ එකතු කිරීම් පිළිබඳව නිසි සැලකිල්ල දැක්විය යුතු වේ.

05. මෙම නියෝග වල,

(i) 'භාණ්ඩ මෙහෙයුම්කරු' යනුවෙන් අදහස් කෙරෙන්නේ භාණ්ඩ මෙහෙයුම්කරුවෙකු ලෙස විනිමය පාලන පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති -

- භාණ්ඩ මෙහෙයුම්කරුවන්ගේ ''සියළු අවදනම් සහ නෛතික බැඳීම් රක්ෂණ ආවරණය'' මගින් ආවරණය වන භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ බහුවිධ ලියකියවිලි නිකුත් කරන ; සහ

- යම් අදළ කාර්තුවක් සඳහා අදල පිරිවැටුමේ වාර්තා සමඟ විනිමය පාලන පනතේ 29ආ වගන්තිය යටතේ විනිමය පාලක විසින් නිකුත් කරන ලද නිවේදනයේ තුන්වන (3) උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයේ පිළියෙල කරන ලද අදළ කාර්තුවක් සමන්විත වන එක් එක් මාසය සම්බන්ධයෙන් විනිමය පාලක වෙත ඉදිරිපත් කළ ප්‍රකාශනවල පිටපත් සහ හතරවන, පස්වන සහ හයවන උපලේඛනයන් හි නිශ්චිත ලෙස දක්වා ඇති ආකෘති පත්‍රයේ පිළියෙල කරන ලද ශුද්ධ ආදයම් ප්‍රකාශය ඉදිරිපත් කරන,

තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයකි.

(ii) 'තැනැත්තා 'යන්නට 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු ද ඇතුළත් වේ.

(iii) 'ප්‍රාථමික වෙළෙන්ද ' යන්නෙහි අර්ථය 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වගන්තියෙහි දී ඇති අර්ථයම වේ.

(iv) 'සුරැකුම්පත් ' යන්නෙන්

(අ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම් පත් ආඥපනත (420 පරිච්ඡේදය) යටතේ නිකුත් කර ඇති සුරැකුම් පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක් ;

(ආ) දේශීය භාණ්ඩාගාර බිල් ආඥපනත (417 පරිච්ඡේදය) යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතක් ; හෝ

(ඇ) මුදල් නීති පනතේ (422 පරිච්ඡේදය) 134 වගන්තිය යටතේ නිකුත් කරන ලද මහ බැංකු සුරැකුම් පතක්,

අදහස් කෙරේ.

09 -796

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.